| | | |
|---|---|---|
| විද්‍යාලය | : | ර/ ඇඹ්පොල ශ්‍රී මහින්ද මහා විද්‍යාලය |
| සිංහල භාෂාව හා සාහිත්‍යය | : | 13 ශ්‍රේණිය පැවරුම් |
| විෂය භාර ගුරු | : | ඊ.ඒ.එස්.එච්. ඇතුල්දූර |
| **නිර්දේශිත ග්‍රන්ථය** | : | **ගුත්තිල කාව්‍යය** |

**ප්‍රශ්නය : ‘ගුත්තිල කාව්‍යය’ පාඨක රසෝද්දීපනයට පාත්‍ර වන්නේ වෑත්තෑවේ හිමියන් කාව්‍යමය රචනා රීතියක් උපයෝගී කරගත් බැවිනි. නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.**

**පිළිතුර සඳහා මග පෙන්වීම :**

★ කතුවරයා හා කෘතිය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

මාර්ටින් වික්‍රමසිංහයන් විසින් ‘සිංහල සාහිත්‍යයේ නැගීම’ නම් කෘතියේ ‘සිංහල කාව්‍යයේ මුදුන් මිණ’ වශයෙන් හඳුන්වා ඇත්තේ ගුත්තිල කාව්‍යයයි. වෑත්තෑවේ හිමියන් සිංහලයන් අතර අතිශයින් ම ජනප්‍රිය ජාතක කතාවක් වූ ‘ගුත්තිල ජාතකය’ මෙහි තේමාව ලෙස යොදා ගත් නමුදු අවස්ථාවට උචිත අර්ථ, ශබ්ද රස පූර්ණ වාග්මාලාවක් හා විවිධ විරිත් කරණකොටගත් බැවින් පාඨක ජනයාගේ රසෝද්දීපනයට මාහැඟි ග්‍රන්ථයක් වූ බැව් කිව යුතු වේ. එසේ ම හෙළ ජන කවි රීතියේත් ව්‍යක්ත කාව්‍ය රීතියේත් අපූර්ව සම්මිශ්‍රණයෙන් නිපදවාගත් කාව්‍ය රීතියක් උපයෝගී කර ගත් ආකාරය පහත සඳහන් නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කළ හැකිය.

★ මූසිල ගාන්ධර්වයා හා බරණැස් නුවරින් පැමිණි වෙළෙඳුන් අතර සිදුවන සංවාදය ජන කවි රීතියෙන් පෝෂිත බව පවසන්න.

144 කවිය - “නොමිහිරිද මේ වෙණ
ඇසූහු ද මින් වැඩි වෙණ
නැත හොත් නැත නුවණ
කියව! නොසතුටු වන්ට කාරණ”

(මෙකී අවස්ථා නිරූපණය **ස්වභාවෝක්තිය** දනවන බව පවසන්න)

★ ගුරුතුමා ගුරු මුෂ්ටිය තබාගෙන තමන් හට ශිල්ප දුන් බව සැක කරමින්, ගුරුතුමා කළ දේ අවිචාරශීලීව කිරීමට ගොස් ඉන් මූසිලට අත් වූ ප්‍රතිඵලය වෑත්තෑවේ හිමියන් කවියෙන් පවසන අයුරු අගයන්න.

287 කවිය - “කෙළෙහි ගුණ සින්දේ
මූසිල අන්ද මන්දේ
ජයෙහි ලොබ බැන්දේ
තමා වීණා තත ද සින්දේ”

(මෙකී අවස්ථා නිරූපණය සඳහා ඵලිසමය පිහිටුවීමෙන් ලැබෙන ආලෝකය පහදන්න)

★ ගුත්තිලයේ ‘සුරපුර සිරි’ වර්ණනයේ අන්තර්ගත පහත සඳහන් කවිය හෙළ ජන කවියේ සරල සුගමබව මෙන් ම රිද්මයානුකූල බවින් ද සමන්විත වන අයුරු පහදන්න.

කවිය - “ගසෙක පැහැය ගව් දෙසියක දිසේයා
මලෙක මෙලෙක සිව්සිය ගව් ඇසේයා
ගලෙක මෙලෙක උන් සක් නැබ වැසේයා
නොයෙක එසග සැප පවසම් කෙසේයා”

(එසේ ම අතිශයෝක්තියෙන් කියැවෙන මෙකී අවස්ථාව පාඨකයා කල්පිත ලොවකට ගෙන යාමට සමත් වේ. මෙය ද ජන කවි කලාවේ තවත් ලක්ෂණයකි.)

★ ගුත්තිල - මූසිල වීණා වාදන තරගය නැරඹීම සඳහා බරණැස් රජතුමා සැරසී, මණ්ඩපයට ප්‍රවේශ වන ආකාරය කවියා ගෙන එන්නේ සංස්කෘත අලංකාරවාදී සිද්ධාන්ත මත ගොඩනැගුණු පැරණි සම්භාව්‍ය කාව්‍ය රීතිය අනුසාරයෙනි.

233 කවිය - “සොඳ පුන් සඳ සොම් කිරණින් පිහිකුළු
වැද සුරගඟ රළ වට කළ සුළකුළු
නඳ සිරිසර පාමින් රන් ගිරිකුළු
ඇඳ පිරිසිදු සුදු සිනිඳු කසී සළු”

(එසේ ම සම්භාව්‍ය කාව්‍යමය උපමා රූපකවලින් ද සමන්විත වන බව පවසන්න.)

★ ගුත්තිල ඇදුරිඳුගේ වීණා නාදයට වශී වූ ‘මානව ලෝකය’ ජන වහරේත්, වියත් වහරේත් මනා සුසංයෝගයෙන් පෝෂිත වාග්මාලාවක් ඇසුරින් පාඨකයා වෙත ගෙන එන අයුරු පහදන්න.

293 කවිය - “නිති නිරිඳුගෙ රැකවලෙහි නියුත්තෝ
රැති ලෙස රුපු’නොද බිඳ ජය ගත්තෝ
පැතිරෙන වෙණ නද බැඳුණ සිතැත්තෝ
අති’නව් ගිලිහෙන බව නොම දත්තෝ”